# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

# Primary Piriven Mid Year Term Test - 2016

5 වසර / Grade 5

**සිංහල I**
**Sinhala I**

**කාලය : පැය තුනයි**
**Time : Three hours**

* I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## I - කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. අ) සිංහල අක්ෂරමාලාවේ අඝෝෂ වර්ගාක්ෂර පිළිවෙළින් ලියා දක්වන්න.

ආ) සිංහල අක්ෂරමාලාවේ සඤ්ඤකාක්ෂර ලියා දක්වන්න.

ii. අ) ශුද්ධ සිංහල අක්ෂරමාලාවේ ඇතුළත් ස්වරාක්ෂර දෙකක් සිදත් සඟරා හෝඩියේ නො එයි. එම ස්වරාක්ෂර දෙක ලියන්න.

ආ) සිදත් සඟරා හෝඩියේ එන මූර්ධජාක්ෂර ලියා දක්වන්න.

iii. පහත දැක්වෙන අකුරු හැඳින්වීමට අව්‍යක්ත ව්‍යවහාරයේ පයනු ෂ යන්න, ගයනු ශ යන්න යන යෙදුම් භාවිත කරනු ලැබේ. එම අකුරු හැඳින්වීමට ව්‍යාකරණ ශාස්ත්‍රයේ දී භාවිත වන නිවැරදි පාරිභාෂික පද එම අකුරු ඉදිරියේ ලියන්න.

අ) ෂ :..................................................................

ආ) ශ :..................................................................

iv. පහත දැක්වෙන වචන පේළි දෙකෙහි එක් එක් පේළියෙහි තිබෙන සදොස් අක්ෂර සහිත පදය තෝරා ලියා දක්වා ඒවායේ නිදොස් අක්ෂර යෙදූ පද ඉදිරියෙන් ලියන්න.

අ) සෞභාග්‍ය, සෞවුන්දර්ය, කායශීලය, සූර්යෝදය

ආ) ත්‍රෛකාලික, මෛථුන, කෛලාස, වෛයිකල්පික

v. පහත දැක්වෙන වචන කාණ්ඩවල සදොස් අක්ෂර වින්‍යාසය සහිත වචන කාණ්ඩයක් ඇත. එම වචන කාණ්ඩය තෝරා ලියා දක්වා ඒවා නිදොස් කොට ඉදිරියෙන් ලියන්න.

අ) වැඩ කරණ ජනයා / පරණ ඇඳුම / සූරන කොටස / කිරන බඩු.

ආ) වපුළ බීජ / පතළ අදහස / විසුළ මල් / මතුල මන්ත්‍රය

vi. අ) පහත දැක්වෙන වාක්‍ය කර්තෘකාරකයට පෙරළා නැවත ලියන්න.

i. අප විසින් ඔවුහු පැසසුණු

ii. වෙළෙන්දා විසින් භාණ්ඩ අළෙවි කෙරුණි.

iii. ජයග්‍රහණය කරණකොට මිනිස්සු සතුටු වෙති.

iv. ඔහු නිසා මම දිරිමත් වුණෙමි.

ආ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට පෙරළා නැවත ලියන්න.

i. ගායකයෝ ප්‍රේක්ෂකයන් කුල්මත් කරති.

ii. මහාචාර්යවරු ශාස්ත්‍රීය පර්යේෂණ සිදුකරති.

iii. නාට්‍ය විචාරකයෝ ප්‍රේක්ෂකයන් දැනුවත් කරති.

iv. ගුරුවරු ශිෂ්‍යයන් සිප් සයුරෙන් එතෙර කරති.

vii. ආ) පහත දැක්වෙන වාක්‍යවල තිබෙන ඉරි ඇඳි පදවල විභක්ති නාමයන් දක්වන්න.

i. ළමයා බස් රියෙන් පාසල් ය යි.

ii. ගොවියා පා පැදියෙන් බැස කුඹුරට ගියේ ය.

iii. අප අවතැන්වූවන්ට පිහිට විය යුතු ය.

iv. මගේ අතින් පොත බිම වැටුණි.

viii. අ) සුදුසු උපසර්ග හිස් තැනට යොදා වාක්‍ය නැවත ලියන්න.

i. ඔවුන්ගේ ජයග්‍රහණය විශිෂ්ට යැයි ජනයා .............................. බඳව ම පවසයි.

ii. ................................. බඳ අපි දැන් කුමක් කරමු ද ?

iii. එම කරුණු.................................... බඳ අවධානය යොමු කළ යුතු ය.

iv. ඒ කවි.................................... බඳ රසික සම්භාවනාවට පාත්‍ර විය.

ආ) සුදුසු විරාම ලකුණු යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

i. උපාසිකාව තෙල් ද මල් ද රැගෙන පන්සලට ගියා ය

ii. අනේ මට පිහිට වෙන්නේ කවුරුන්ද

iii. ළමයින් හෙට පාසලට යා යුතුය

iv. ගම්පෙරළිය කලියුගය හා යුගාන්තය තුන් ඈඳුතු නවකතා වේ

ix. අ) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට සුදුසු ප්‍රශ්න වාචික සර්වනාම පද යොදා එම වාක්‍ය ප්‍රශ්න වාක්‍ය බවට පෙරළා නැවත ලියන්න.

i. ළමයි ජයග්‍රහණය ලබති.

ii. අලගියවන්නයෝ සුභාෂිතය ලියූහ.

iii. මව දරුවා කැටුව විහාරයට යයි.

iv. ඔවුහු පහසුවෙන් ජය ලැබූහ.

ආ) සුදුසු නිපාත පද හිස් තැන්වලට යොදා වාක්‍ය නැවත ලියන්න.

i. අම්මා මල්ලී ............................... පන්සල් ගියාය.

ii. ගවයා කමතේ ............................... කුඹුරේ ............................... වැඩ කරයි.

iii. දරුවන් ...............................දෙමාපියෝ වෙහෙසෙති.

iv. තෙරුවන් ............................... අපට කවර පිහිටක් ද?

x. අ) පහත දැක්වෙන භාවකාරක වාක්‍යවල කර්තෘ අනුක්ත රූපයෙන් තබා ඇත. ක්‍රියාපදය නිරුත්සාහික ක්‍රියා පදයකි. එම වාක්‍යවල කර්තෘ පදය උක්ත රූපයෙන් ද ක්‍රියා පදය කර්තෘ කාරකයෙන් ද තබා වාක්‍ය නැවත ලියන්න.

i. දරුවාට ඇඬෙයි. ii. ඔවුන්ට සිතෙයි.

iii. මට එය කැවුණි iv. ජයග්‍රාහකයන්ට සතුට දැනෙයි.

ආ) පහත දැක්වෙන නාමවලට ඉදිරියෙන් ඇති ප්‍රත්‍යය එක්කොට තද්ධිතනාම තනා ඒවා ලියා දක්වන්න.

i. කන් + ඉෂ්ඨ ii. විකල්ප + ඉක

iii. සුභග + ය iv. ත්‍රිකාල + ඉක

(ලකුණු - 4 × 10 =40 යි.)

## II - කොටස

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 - 250 පමණ වන සේ රචනයක් ලියන්න.

i. ස්වාභාවික විපත් අවම කර ගනිමු. ii. කාබනික ගොවිතැන ව්‍යාප්ත කරමු.

iii. පන්සිල් රකින සමාජයක වැදගත්කම. iv. අපට ම උරුම වූ වාපි සංස්කෘතිය.

(ලකුණු - 15)

03. පහත දී තිබෙන පද්‍යය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

i. මෙහි වර්ණිත විහාරය උපමා කර ඇත්තේ කුමකට ද?

ii. මෙහි ළමා වසුපැටියන් යනු කවර විභක්ති පදයක් ද?

iii. දුරට ඇසෙන්නේ කාගේ හඬ ද?

iv. ප්‍රදේශයේ සශ්‍රීක බව ඇඟවෙන කරුණු 2ක් දක්වන්න.

v. මෙම පද්‍යයේ එන නිපාත පද 2ක් උපුටා දක්වන්න.

(ලකුණු - 15)

## III - කොටස

04. පහත දැක්වෙන ඡේද වචන 50කින් පමණ සාරාංශ කර ලියන්න.

තාන්න මාන්න හා නිලතල ලෝභයෙන් ඇතැම් සිංහලයෝ පුරන් අප්පුලාගේ ගමන් මාර්ගය පිළිබඳව ඉංග්‍රීසීන්ට තොරතුරු දැන්වීමට තරම් දීන වූහ. කුඩාපොළ හිමියෝ අභීත හිමිනමක් වූහ. පන්සල් බිමේ දී ම වෙඩි තබා ඝාතනය කරනු ලැබුව ද ඒ හිමියෝ එක වදනකිනුදු ජාතිය පාවා නො දුන්හ.

පුරන් අප්පුගේ සේනාව මාතලේ සිට මහනුවරට ගමන් ගනිමින් සිටියහ. ඔත්තුවකට අනුව මැලේ ජාතික භටයින් ද පිරිවරා ඉංග්‍රීසි හමුදාව ඔවුන් සොයා ආහ. ඇති වූ දරුණු සටනෙහි ප්‍රතිඵලය වූයේ පරාජයට පත් පුරන්අප්පු ඇතුළු පිරිස සිරභාරයට පත් වීම යි.

1848 අගෝස්තු 8 වෙනිදා පෙරවරුවෙහි පුරන්අප්පුට විරුද්ධව නඩු විභාගය යුද්ධාධිකරණය ඉදිරියෙහි පවත්වන ලදී. එම නඩුවට චෝදනා ගණනාවක් ඉදිරිපත් විය. එහෙත් පුරන්අප්පු නිවටයකු නොවී ය. ඔහු අභීතව තමන්ට එරෙහිව ඉදිරිපත් කළ චෝදනා පිළිගත්තේ ය. ඔහුට හිමි වූයේ මරණ දඬුවම යි.

(ලකුණු - 15)

05. ඔබ පිරිවෙන් ආයතනයේ පවත්වන වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ පුවත්පතක පළකිරීම සඳහා ලිපියක් සම්පාදනය කරන්න. (වචන 100 - 150ක් පමණ සෑහේ)

(ලකුණු - 15)

06. i. "කපනු" (කැපීමෙහි) යන විධික්‍රියා ධාතුව වර්තමාන කාල කාර්තෘකාරකයෙහි සියලු පුරුෂවල ඒකවචන බහුවචන දෙකෙහි වරනගා වගුගත කරන්න.

ii. "ගයන" යන කෘදන්ත නාමය පුරුෂලිංගයෙහි සියලු විභක්තිවල ඒකවචන බහුවචන දෙකෙහි වරනගා වගු ගතකර දක්වන්න.

(ලකුණු - 15)

# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

# Primary Piriven Mid Year Term Test - 2016

5 වසර / Grade 5

**සිංහල *II*** | **කාලය : පැය තුනයි**

**Sinhala II** | **Time : Three hours**

* ***I* කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද *II* කොටසින් ප්‍රශ්න හතරක් ද, තෝරාගෙන ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**

## *I* – කොටස

01. දී ඇති පාඨ ලිහිල් බසින් ලියා, නැවත තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙනම ලියා දක්වන්න.

i. ඒ ජේතවනයෙහි මේඝපටලයෙන් සුඹුනා ලද ශිඛරමාලා ඇති කෛලාස පර්වතයක් වැනි වූ.

(ලකුණු - 04)

ii. නිලුපුල් මල් මිටි ආදියෙන් සරහා මහා බෝධීන් වහන්සේ වට කොටැ පූර්ණ ඝට පංක්තියක් තැබ්වූයේ යැ.

(ලකුණු - 04)

iii. පාංශුකූල චීවරයන් පොරවා මාණික්‍යමය වූ සන්නාහයෙන් සන්නද්ධ වූ හස්ති රාජයන් පරිද්දෙන් ධර්ම සභා මණ්ඩපයට රැස්ව.

(ලකුණු - 04)

iv. එදවස් පිළිගත් යව් කැලි හා මුසු කොටැ වළඳන්නට නො වටනේයැ, යනාදීන් විනය විසජ්ජනය කරවා.

(ලකුණු - 04)

v. දවහත් තරු වැළක් මෙන් දිලිසෙන්නා වූ ප්‍රමාණාතික්‍රාන්ත වූ හස්ති අශ්ව රථ පදාති යැයි කියන ලද චතුරංගණී සේනාව විසින් පිරිවරන ලද්දේ.

(ලකුණු - 04)

vi. යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ සිත උත්පත්ති ක්ෂණයෙහි උපදී ද, නිරෝධ ක්ෂණයට නො ගියේ ද

(ලකුණු - 04)

vii. සුපුෂ්පිත වූ පද්ම නමැති මුඛයෙහි කෙසරු සළා නමැති දන්ත පංක්තීන් නන්දා නම් පුෂ්කරණීයෙහි ශ්‍රී සමෘද්ධියට අපහාස කරන්නාක් වැනි.

(ලකුණු - 04)

viii. අ) වටින නොයෙක් බඩු අරගෙන  ඇමදාම
වටින මිලට නොවිකොට කොට  වෙළෙඳාම

ආ) ලද යම් කෙනෙක් සරසවි බැලුමසක්  නිසි
කොතරම් වුවත් මුළු ලොව කරති  අතවැසි

(ලකුණු - 04)

ix. අ) අයෙක් මිසදිටු  ගත්
රාම සීතා කතා  තෙපළත්

ආ) එන සඳ මෙපුර පෙර කිරි සිඳු දුව  තුටුව
සිඳු රද විසින් ඇය රැකරවරණට  කැටුව

(ලකුණු - 04)

x. පහත දැක්වෙන උද්ධෘතවල අවස්ථා සම්බන්ධය ලියන්න.

ආ) "එසින් තබා කියමින් මිනිඳු ගුණගය
පිනත් බඳුව වැඳ පෙති පිළිම මහගය"

ආ) "මාගේ මනදොළ සම්සේ සමෘද්ධි වී ද
එපරිද්දෙන් ම නුඹ වහන්සේගේ මනෝරථය ද සිද්ධ වේවා"

(ලකුණු - 04)

## II - කොටස

02. සිංහල බෝධිවංශය ධර්ම පුස්තකයක් මෙන් ම ඓතිහාසික ග්‍රන්ථයක් ලෙස ද අගය කළ හැකි ය. මෙතෙක් ඉගෙනගත් කොටස් ඇසුරින් විමසන්න.

(ලකුණු - 15)

03. ගිරා සන්දේශයෙන් හෙළිවන තත්කාලීන සමාජයේ ආර්ථික තොරතුරු පිළිබඳ ඔබ උගත් පද්‍ය ඇසුරින් විමසීමක් කරන්න.

(ලකුණු - 15)

04. ඩිංගිරි මැණිකා නවකතාව හඳුන්වා දිය හැක්කේ ප්‍රචාරාත්මක ගුණයෙන් යුක්ත වූවක් ලෙස යි. මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු - 15)

05. කොළඹ යුගයේ කවීන්ගේ බොහෝ නිර්මාණ අද්භූත සෞන්දර්යවාදී රීතියට අනුව රචනා වී ඇත. පද්‍යාවලියේ මුල් පද්‍ය පංති දෙකක් ඇසුරින් විමසන්න.

(ලකුණු - 15)

06. පහත සඳහන් කවීන් අතරින් එක් අයෙකුගේ නිර්මාණවල සුවිශේෂීතාව පැහැදිලි කරන්න.

i. එස්. මහින්ද හිමි

ii. විමලරත්න කුමාරගම

iii. සාගර පලන්සූරිය

iv. පී. බී. අල්විස් පෙරේරා

(ලකුණු - 15)

07. ගිරා සන්දේශ කතුවරයා ස්වභාවෝක්ති අලංකාරය ප්‍රිය කළ කවියෙකි. මුල් "වන වැනුම" ඇසුරින් මේ කියමන විමසන්න.

(ලකුණු - 15)

The National e-learning Portal for The General Education